# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2487/29 - 2026 මැයි මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2026.05.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු 20 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2026 මැයි මස 07 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි **"2026 අංක 04 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි"** ලෙස හඳුන්වනු ලැබේ.
2. වරින් වර සංශෝධනය කරන ලද, 2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/77 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි මෙමගින් තවදුරටත් සංශෝධනය කෙරේ.
3. **සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ 84.15, 84.18, 84.19, 84.79, 87.04, සහ 87.07 යටතේ වර්ගීකරණය කරන ලද සහ මෙම *ගැසට් පත්‍රයේ* I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFC) ශීතකාරක සමඟ පමණක් ක්‍රියා කරන** පිළිසකසන ලද, භාවිත කරන ලද හෝ අලුත්ම භාණ්ඩ ආනයනය කිරීම 2026 ජූනි 06 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි තහනම් කරනු ලැබේ.


1A - PG 7697 — 373 (2026/05)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. ඉහත රෙගුලාසි අංක 3 හි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා ශීතකරණ පද්ධතියේ සංරචකයක් ලෙස භාවිත කරන **සහ** මෙම *ගැසට් පත්‍රයේ* **I වන උපලේඛනයේ** නිශ්චිතව දක්වා ඇති හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් සමඟ පමණක් ක්‍රියා කරන, **සංයෝජිත වර්ගීකරණ කේත 8414.30** යටතේ වර්ගීකරණය කරන ලද සම්පීඩක ආනයනය කිරීම සඳහා 2028 ජනවාරි 01 වන දින දක්වා පමණක් අවසර දෙනු ලැබේ.

5. පිළිවෙලින්, 2026 ජූනි 06 දින හෝ ඊට පසු සහ 2028 ජනවාරි 01 දින හෝ පසු ආනයනය කරන ලද ඉහත රෙගුලාසි අංක 3 සහ 4 හි සඳහන් භාණ්ඩ ශ්‍රී ලංකා රේගුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් රේගු ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව රාජසන්තක කරනු ලැබිය යුතු අතර එම භාණ්ඩ නිෂ්කාශනය පරිසර විෂය භාර අමාත්‍යාංශයේ පුහුණු අරමුණු සඳහා පමණක් සිදු කරනු ලැබිය යුතුය.

6. රෙගුලාසි අංක 3 සහ 4 හි සඳහන් භාණ්ඩ ආනයනය කරන අවස්ථාවේ දී, ආනයනකරු විසින් නිෂ්පාදකයා හෝ ජාත්‍යන්තරව පිළිගත් / ප්‍රතීතනය ලත් ආයතනයක් විසින් නිසි ලෙස සහතික කරන ලද ශීතකාරක නාම කේතය වැනි විස්තර ඇතුළුව, එවැනි උපකරණවල අඩංගු ශීතකාරක වර්ගය දැක්වෙන ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

## I වන උපලේඛනය

*හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFC) ශ්‍රේණියේ රසායනික ද්‍රව්‍ය ලැයිස්තුව*

| | *විස්තරය* | *රසායනික සූත්‍රය* | *ද්‍රව්‍යය* | *සංයෝජිත වර්ගීකරණ කේතය* |
|---|---|---|---|---|
| 1 | ඩයික්ලෝරෝෆ්ලෝරෝමීතේන් | $CHFCl_2$ | HCFC -21 | 2903.77.13 |
| 2 | ක්ලෝරෝඩයිෆ්ලෝරෝමීතේන් | $CHF_2Cl$ | HCFC -22 | 2903.71 |
| 3 | ටෙට්‍රාක්ලෝරෝෆ්ලෝරෝඊතේන් | $C_2HFCl_4$ | HCFC -121 | 2903.77.34 |
| 4 | ට්‍රයික්ලෝරෝඩයිෆ්ලෝරෝඊතේන් | $C_2HF_2Cl_3$ | HCFC -122 | 2903.77.32 |
| 5 | ට්‍රයික්ලෝරෝෆ්ලෝරෝඊතේන් | $C_2H_2FCl_3$ | HCFC -131 | 2903.77.31 |
| 6 | ඩයික්ලෝරෝඩයිෆ්ලෝරෝඊතේන් | $C_2H_2F_2Cl_2$ | HCFC -132 | 2903.77.25 |
| 7 | ක්ලෝරෝට්‍රයිෆ්ලෝරෝඊතේන් | $C_2H_2F_3Cl$ | HCFC -133 | 2903.77.22 |
| 8 | ඩයික්ලෝරෝෆ්ලෝරෝඊතේන් | $C_2H_3FCl_2$ | HCFC -141 | 2903.73 |
| 9 | ඩයික්ලෝරෝෆ්ලෝරෝඊතේන් | $CH_3CFCl_2$ | HCFC -141b | 2903.73 |
| 10 | ක්ලෝරෝඩයිෆ්ලෝරෝඊතේන් | $C_2H_3F_2Cl$ | HCFC -142 | 2903.74 |
| 11 | ක්ලෝරෝඩයිෆ්ලෝරෝඊතේන් | $CH_3CF_2Cl$ | HCFC -142b | 2903.74 |
| 12 | හෙක්සාක්ලෝරෝෆ්ලෝරෝප්‍රොපේන් | $C_3HFCl_6$ | HCFC -221 | 2903.77.74 |
| 13 | පෙන්ටාක්ලෝරෝඩයිෆ්ලෝරෝප්‍රොපේන් | $C_3HF_2Cl_5$ | HCFC -222 | 2903.77.72 |
| 14 | ටෙට්‍රාක්ලෝරෝට්‍රයිෆ්ලෝරෝප්‍රොපේන් | $C_3HF_3Cl_4$ | HCFC -223 | 2903.77.68 |
| 15 | ට්‍රයික්ලෝරෝටෙට්‍රාෆ්ලෝරෝප්‍රොපේන් | $C_3HF_4Cl_3$ | HCFC -224 | 2903.77.64 |
| 16 | ඩයික්ලෝරෝපෙන්ටාෆ්ලෝරෝප්‍රොපේන් | $C_3HF_5Cl_2$ | HCFC -225 | 2903.75 |
| 17 | ඩයික්ලෝරෝපෙන්ටාෆ්ලෝරෝප්‍රොපේන් | $CF_2ClCF_2CHClF$ | HCFC -225cb | 2903.75 |
| 18 | ක්ලෝරෝහෙක්සාෆ්ලෝරෝප්‍රොපේන් | $C_3HF_6Cl$ | HCFC -226 | 2903.77.46 |
| 19 | පෙන්ටාක්ලෝරෝෆ්ලෝරෝප්‍රොපේන් | $C_3H_2FCl_5$ | HCFC -231 | 2903.77.71 |
| 20 | ටෙට්‍රාක්ලෝරෝඩයිෆ්ලෝරෝප්‍රොපේන් | $C_3H_2F_2Cl_4$ | HCFC -232 | 2903.77.67 |
| 21 | ට්‍රයික්ලෝරෝට්‍රයිෆ්ලෝරෝප්‍රොපේන් | $C_3H_2F_3Cl_3$ | HCFC -233 | 2903.77.63 |
| 22 | ඩයික්ලෝරෝටෙට්‍රාෆ්ලෝරෝප්‍රොපේන් | $C_3H_2F_2Cl_4$ | HCFC -234 | 2903.77.54 |
| 23 | ක්ලෝරෝපෙන්ටාෆ්ලෝරෝප්‍රොපේන් | $C_3H_2F_5Cl$ | HCFC -235 | 2903.77.45 |
| 24 | ටෙට්‍රාක්ලෝරෝෆ්ලෝරෝප්‍රොපේන් | $C_3H_3FCl_4$ | HCFC -241 | 2903.77.66 |
| 25 | ට්‍රයික්ලෝරෝඩයිෆ්ලෝරෝප්‍රොපේන් | $C_3H_3F_2Cl_3$ | HCFC -242 | 2903.77.62 |
| 26 | ඩයික්ලෝරෝට්‍රයිෆ්ලෝරෝප්‍රොපේන් | $C_3H_3F_3Cl_2$ | HCFC -243 | 2903.77.53 |
| 27 | ක්ලෝරෝටෙට්‍රාෆ්ලෝරෝප්‍රොපේන් | $C_3H_3F_4Cl$ | HCFC -244 | 2903.77.44 |

| | *විස්තරය* | *රසායනික සූත්‍රය* | *ද්‍රව්‍යය* | *සංයෝජිත වර්ගීකරණ කේතය* |
|---|---|---|---|---|
| 28 | ඩයික්ලෝරෝඩයිෆ්ලෝරෝප්‍රොපේන් | $C_3H_4F_2Cl_2$ | HCFC -252 | 2903.77.52 |
| 29 | ක්ලෝරෝෆ්ලෝරෝමීතේන් | $CH_2FCl$ | HCFC -31 | 2903.77.11 |
| 30 | ඩයික්ලෝරෝට්‍රයිෆ්ලෝරෝඊතේන් | $C_2HF_3Cl_2$ | HCFC -123 | 2903.72 |
| 31 | ඩයික්ලෝරෝට්‍රයිෆ්ලෝරෝඊතේන් | $C_2HCl_2F_3$ | HCFC -123 | 2903.72 |
| 32 | ක්ලෝරෝටෙට්‍රාෆ්ලෝරෝඊතේන් | $C_2HF_4Cl$ | HCFC -124 | 2903.77.23 |
| 33 | ක්ලෝරෝටෙට්‍රාෆ්ලෝරෝඊතේන් | $C_2HFClF_3$ | HCFC -124 | 2903.77.23 |
| 34 | ක්ලෝරෝෆ්ලෝරෝඊතේන් | $C_2H_4CFCl$ | HCFC -151 | 2903.77.21 |
| 35 | ඩයික්ලෝරෝපෙන්ටාෆ්ලෝරෝප්‍රොපේන් | $CF_3CF_2CHCl_2$ | HCFC -225ca | 2903.75 |
| 36 | ට්‍රයික්ලෝරෝෆ්ලෝරෝප්‍රොපේන් | $C_3H_4FCl_3$ | HCFC -251 | 2903.77.61 |
| 37 | ක්ලෝරෝට්‍රයිෆ්ලෝරෝප්‍රොපේන් | $C_3H_4F_3Cl$ | HCFC -253 | 2903.77.43 |
| 38 | ඩයික්ලෝරෝෆ්ලෝරෝප්‍රොපේන් | $C_3H_5FCl_2$ | HCFC -261 | 2903.77.51 |
| 39 | ක්ලෝරෝඩයිෆ්ලෝරෝප්‍රොපේන් | $C_3H_5F_2Cl$ | HCFC -262 | 2903.77.42 |
| 40 | ක්ලෝරෝෆ්ලෝරෝප්‍රොපේන් | $C_3H_6FCl$ | HCFC -271 | 2903.77.41 |

EOG 05 - 0122

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.